ලංකාදීප

# චීන කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ දූත පිරිස මිලින්ද මොරගොඩ හමුවී



චීන කොමියුනිස්ට් පක්ෂයේ ජාත්‍යන්තර පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අමාත්‍ය ග්ඕ යෙජු මහතා ප්‍රධාන දූත පිරිසක් පාත්ෆයින්ඩර් පදනමේ පෑලියගොඩ ප්‍රධාන කාර්යාලයට පැමිණ එහි නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා හමුවිය.

දෙරට අතර ආයතනික මට්ටමේ සම්බන්ධතා තවදුරටත් තහවුරු කිරීම සඳහා ගත හැකි පියවර සහ එක මාවතක් හා එක තීරයක් වැඩසටහන මගින් ලබා ගත හැකි අවස්ථා පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරිණි. ආසියානු බියුරෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මා ක්ෂුයුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ හු ක්ෂින්වොන් ඇතුළු පිරිස සමග ප්‍රධාන විධායක කේ. බාලසුන්දරම්, පාත්ෆයින්ඩර් පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක, අධ්‍යක්ෂ ආචාර්ය ජයනාත් කොළඹගේ සහ විධායක අධ්‍යක්ෂක ලක්ෂ්මන් සිරිවර්ධන යන මහත්වරුන් ද මේ අවස්ථාවට සහභාගි වූහ.